# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## භාෂා පරිවර්තක ( ඉංග්‍රීසි/ සිංහල- දෙමළ) තනතුරට බඳවා ගැනීම (බාහිර )

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ඉහත තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**(1) රැකියා විස්තරය**

- වාර්තා/ලිපි/ලේඛන ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල හෝ දෙමළ භාෂාවට හෝ සිංහල හෝ දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම.
- වාර්තා/ලිපි/ලේඛන දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට හෝ සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම.
- බාහිර පාර්ශවයන් වෙතින් සිදු කර ගනු ලබන පරිවර්තන කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.
- කෙටුම්පත් සහ ලේඛන සෝදුපත් කියවීම සහ සමාලෝචනය කිරීම.

**(2) අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව විෂයය සහිතව උපාධියක් ලබා තිබීම.

සහ

දිවුරුම් දුන් පරිවර්තකයෙකු ලෙස සුදුසුකම් ලැබීමෙන් පසු වසර 03ක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**(3) බඳවා ගැනීමේ පටිපාටිය**

ලිඛිත විභාගයේ , ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සහ ප්‍රායෝගික පරීක්ෂණයේ කුසලතා ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.

**(4) වැටුප් පරිමාණය :-** TRC 4.1 -රු. 70,380 (10x1173) -(10x1564)-(10x1955)-(10x2346) – 140,760

**(5) වයස** : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-45 අතර විය යුතුය.

**(6) අයදුම්කිරීමේ ක්‍රමය**

1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk. වෙතින් බාගත කර ගත හැකිය.
2. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා නොසපුරාලන අයදුම්පත් සලකා බලනු නොලැබේ
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
5. සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව **2025.03.05 දින හෝ එදිනට පෙර** "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "දෙමළ භාෂා පරිවර්තක තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය.
6. අයදුම්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතික සමඟ careers@trc.gov.lkවිද්‍යුත් තැපෑලට එවිය යුතුය. විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව "භාෂා පරිවර්තක තනතුරට බඳවා ගැනීම (බාහිර) - 2025" විය යුතුය.
7. රජයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.
8. අයදුම්පත් **2025.03.05 දින හෝ එදිනට පෙර** ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

**(7) පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා සෘජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.


අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක 276
ඇල්විටිගල මාවත
කොළඹ 08